# ස්වාමිනි, ඔබ ගියෙන් හැර මා

පෙරත් බුදු බව පතන්නට ඇති නොමැත තරහක් හදේ නැඟුනේ
ලොවම වෙනුවෙන් නැහෙන්නට ඇති සියල්ලන් හැර දාම සසරේ
මමම ඔබගේ පතිනි වෙන්නැති නොමැත අඩුවක් ආලේ දැනුනේ
ඔබ නිසා දුක් ගැහැට ගන්නැති නොමැත සොඳුරේ එයින් තැවුනේ

සුදුසු කාලෙලු දීග ගියෙ මා ඇත හිතේ ආදරය පිරිලා
තුරුලු කරගෙන ආව ආලය ඔබ සමඟ සමරන්න කියලා
කුසට ආ දින පුංචි ආහුල සතුටු වුනෙ ඔබ මාව සිඹලා
හිතම ගල් කර ගියේ කෙලෙසද පුතු සමඟ මා මෙහිම තියලා

දමා මැදුරේ තනිව මා ගිය අයුරු දෙනෙතේ තාම රැඳුනේ
සිඟිති පුතු විමසනා විට ඔබ, නොමැත සාමිනෙ වචන නැඟුනේ
මාලිගාවකි මගේ නිවහන නොමැත අඩුවක් කිසිත් තිබුනේ
නමුත් හිමියනෙ ඔබ නොමැති විට අමාවක හැමදාම දිලුනේ.

කෲර බියකරු වනය තුළ ඔබ දුක් විඳිනවලු කෙනෙක් කිව්වා
කුසට අහරක් නොලැබෙනා විට ජලය බොනවලු කුසම පුරවා
මහාමේරුව මෙන් නොසෙල්ලී ඉවසලා ඉමි පුතුන් උදෙසා
නොමැතිනම් හිමියනේ වනයට මමත් එනවා ඔබව සොයලා

ලොවේ සතහට සෙත සදන්නට ගිය නිසා ඔබ අපව දමලා
නැත තරහවක් හදේ කිසි විට ස්වාමිනෙ ඔබ වෙතට ලියලා
නොහැක දුක් ගිනි දරා ගන්නට නොමැත ඔබ සේ පෙරුම් පුරලා
ඉවසලා ඉමි මියැදුනෙකු සේ, ස්වාමිනි ඔබ ගියෙන් හැර මා


**නම - සලිනි සශ්‍රිකා විත්තම්පෙරුම ආරච්චිගේ**
**වයස් සීමාව - අවු. 16 – 29**
**විද්‍යුත් ලිපිනය - salinisassrika94@gmail.com**
**හැඳුනුම්පත් අංකය - 945350431v**
**වයස - අවුරුදු 27 මාස 07 දින 06**